# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,490 - 2026 මැයි මස 22 සිකුරාදා - 2026.05.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 176 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 177 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තතු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජුනි මස 12 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මැයි මස 29 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


175 - B 082794 - (2026/05)
E - 01

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (04) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සඳුමිණි නිසංසලා කුමාරි සේරසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983.03.30 වන දින ප්‍රදානය කර ඇති අංක මහ/ප්‍ර/2336 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන තෙන්නකෝන්පතිරණගේ ලීලාවතී වෙත ප්‍රදානය කොට මහනුවර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/E/250/671 යටතේ 1984.07.26 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැතිවීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.06.12 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

## උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේගම්පහ පත්තුවේ පල්ලේතලවින්න (නව - කැන්දලියද්ද) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පරණගම (නව - මොරගස්කොටුව) නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක පී. පී. ඒ. 1256 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 14 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 01 යි, රූඩ් 03යි, පර්චස් 14 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම : කටුගස්තොටවත්ත ජනපද

| | |
|---|---|
| *උතුරට* | : **කැබැලි අංක 15** |
| *නැගෙනහිරට* | : **ජනපද පාර** |
| *දකුණට* | : **කැබැලි අංක 13** |
| *බස්නාහිරට* | : **කැබැලි අංක 17 සහ 07** |

එස්. එන්. කේ. සේරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
පාතදුම්බර.

2026 අප්‍රේල් මස 07 වැනි දින.

05-279

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (04) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

වයඹ පළාත් සභාවේ පුත්තලම දිස්ත්‍රික්කයේ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්/ ඩබ්. එම්. එස්. එල්. විජේසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.12.30 දින ප්‍රදානය කර ඇති අංක පුත්/ප්‍ර/2978 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන ධර්මපාලය, ආණමඩුව පදිංචි ලියනගේ විනීතා පද්මසිරි වෙත ප්‍රදානය කොට පුත්තලම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ආණ 6/246 යටතේ 1985.09.02 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකැමති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතවයක් ඇත්නම් එය 2026.06.12 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

## උපලේඛනය

**පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ, ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුමාර වන්නි පත්තුවේ/ වඩිගමංගාව (වර්තමානයේ 659-ඒ ධර්මපාලය) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දරුම්පාල (වර්තමානයේ ධර්මපාලය) ගමේ පිහිටා ඇත්තාවූද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත - අංක අ. ග. පි. 3639 දරන පිඹුරේ අංක 09 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් අක්කර 01 පර්චස් 22 ක විශාලත්වය ඇත්තාවූද නුගගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.**

| | |
|---|---|
| *උතුරට* | : **අ. ග. පි. 3639 ලොට් අංක 2 සහ 7** |
| *නැගෙනහිරට* | : **එම ලොට් අංක 8 සහ පාර** |
| *දකුණට* | : එම ලොට් අංක 2 සහ පාර |
| *බස්නාහිරට* | : **එම ලොට් අංක 2** |

ඩබ්. එම්. එස්. එල්. විජේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ආණමඩුව.

2025 නොවැම්බර් මස 19 වැනි දින.

05-280

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (04) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

වයඹ පළාත් සභාවේ පුත්තලම දිස්ත්‍රික්කයේ නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ආර්. පී. නවම් උදානි වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.29 දින ප්‍රදානය කර ඇති අංක පුත්/ප්‍ර/නව 26749 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වෙලේවැව පදිංචි කුරුකුලසූරිය මර්වින් කැස්පියර් පීරිස් යන අය වෙත ප්‍රදානය කොට පුත්තලම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 223/48 යටතේ 2000 මැයි 26 වන දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකැමති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.06.12 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරිමැටියාව පත්තුවේ/ කෝරලේ 646/2 වෙලේවැව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වෙලේවැව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, පුත්තලම මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ග. පි. 3216 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 820 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.998 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම :

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 819 (දිය බස්නා ඇල) |
| *නැගෙනහිරට* | : කැබලි අංක 818 |
| *දකුණට* | : කැබලි අංක 834 සහ පාර |
| *බස්නාහිරට* | : කැබලි අංක 821 |

ආර්. පී. නවම් උදානි,
ප්‍රාදේශීය ලේකම්,
නවගත්තේගම.

2026 ජනවාරි මස 29 වැනි දින.

05-281

---

## ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය: 4/10/80618
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය: PLC/L2/LP/18/32

21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

රත්නපුර දිස්ත්‍රික්කයේ කල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 258, කල්තොට ග්‍රාම නිලධාරී වසමේ කල්තොට ගමේ අංක කැ.සි 620016 හි කලාප 09 කැබලි අංක 23 න් කොටසක් දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් 02 පර් 28.7 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුත්තක් සඳහා සී/ස බලංගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ. :

| | |
|---|---|
| *උතුරට* | : ක.සි 620016හි කැබලි අංක 9 :23 ඉතිරි කොටස සහ 9 :22 |
| *නැගෙනහිරට* | : කැබලි අංක 9:22 සහ 9:26 |
| *දකුණට* | : කැබලි 9:26 සහ මාර්ගය |
| *බටහිරට* | : මාර්ගය |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :

(අ) බදු කාලය : අවුරුදු තිහ යි. (30) (2026.04.07 සිට 2056.04.06 දක්වා);

(ආ) වාර්ෂික බදු මුදල : ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2026 වර්ෂයේ වෙළෙඳපොල වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 50% ට එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.;

(ඇ) මෙම ඉඩම වාණිජ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය;

(ඉ) පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

(ඊ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය;

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත්වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(ඌ) 2026.04.07 දින සිට වසර 05 ක් ගත වනතුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

(එ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදුගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොලියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට

2026 මැයි මස 06 දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, "මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේදීය.

05-284

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය:- 4/10/22277
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය:- එන්සීපී/පීඑල්සී/200

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

උතුරුමැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක167, පොත්ගුල් පෙදෙස ග්‍රාම නිලධාරී වසමේ වසමේ වාරිමාර්ග පෙදෙස ගමේ පිහිටි අංක අ.ප.පි.පො.160 පිඹුරේ අනුරේඛනයේ අංක 1793 දරන බිම් කැබැල්ල ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0495ක් පමණ වූ රජයේ ඉඩම් කොටස නේවාසික කටයුතු සඳහා රණමුක මුදියන්සේලාගේ සෝමලතා මැණිකේ මහත්මිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ. :

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 1244 |
| *නැගෙනහිරට* | : කැබලි අංක 1224 |
| *දකුණට* | : කැබලි අංක 1794 හා 532 |
| *බටහිරට* | : කැබලි අංක 1794 හා 1243 |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :

(අ) බදු කාලය : අවුරුදු තිහයි. (30) (1995.01.01 දින සිට 2024.12.31 දින දක්වා)

වාර්ෂික බදු මුදල : ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු : වටිනාකමින් 4% කි.
දඩ මුදල : ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ දියුණු වටිනාකමින් 4%ක් වූ මුදල මෙන් තුන් ගුණයකි;

(ආ) දෙවන බදු කාලය : අවුරුදු තිහයි. (30) (2025.01.01 දින සිට 2054.12.31 දින දක්වා)

වාර්ෂික බදු මුදල : පළමු බදු කාලය අවසානයේ අය කළ බදු මුදලට 50% ක් එකතු කර ලබා ගන්නා මුදල වේ.

වාර මුදල : අය නොකෙරේ;

(ඇ) මෙම ඉඩම පදිංචියට නිවාසයක් තැනීම සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.;

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය;

(ඉ) පළාත් ඉඩම් කොමසාරිස් / ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

(ඊ) සාදා ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වකින් පවත්වාගෙන යා යුතුය;

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත්වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(ඌ) **1995.01.01** සිට වසර 05 ක් ගතවන තුරු හා බදුකරයක් සකස් කරන තුරු පවුල තුළ පැවරීම් හැර වෙනත් පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

(එ) මෙම ඉඩම සඳහා දීමනා පත්‍රයක් ලබා ගැනීමේ හිමිකම ඉඩමේ නිවසක් ඉදිකර සංවර්ධනය කර ස්ථිර පදිංචි වූ පසුව සහ වසර 25ක් තුළ නිදහස් දීමනාපත්‍ර ඉල්ලුම් කරනු ලබන්නේ නම් නොදියුණු වටිනාකම හා වාර මුදල් / දඩ මුදල් ද, වසර 25 කට පසුව ඉල්ලුම් කරනු ලබන්නේ නම් නොදියුණු වටිනාකම ද ඇතුළත්ව ඉල්ලුම් කරනු ලබන දින දක්වා සියලු බදු මුදල් ගෙවීමෙන් පසුව හිමිවේ;

(ඒ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැරහැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොළියක් අයකරනු ලැබේ;

(ඔ) නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම අන්සතු කිරීමේ දී නියම කරන ලද කාලසීමාව තුළ නිවාස කටයුතු සම්පූර්ණ කළ යුතු අතර, එසේ කිරීමට අසමත් වුවහොත්, මෙම බදුකරය අහෝසි වූවා සේ සැලකෙන අතර, රජය වෙත නැවත ඉඩම පැවරීමට සිදුවේ.

ගැසට් පත්‍රයේ පළ කළ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

**එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,**
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 මැයි මස 07 දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

05-283

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/57789.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* NP/28/04/02/41/JF/5005

## 21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

යාපනය දිස්ත්‍රික්කයේ යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රික්ලමේෂන් බටහිර (J/69) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගුරුනගර් ගමේ අනුරේඛන අංක Ja/JFF/2018/199 කැබලි අංක D වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.6495 වූ රජයේ ඉඩම් කොටසක් වාණිජ කටයුතු සඳහා නෝර්ත් සී ලිමිටඩ් (Northsea Ltd) විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ. :

| | | |
|---|---|---|
| *උතුරට* | : | වීදිය |
| *නැගෙනහිරට* | : | රජයේ ඉඩම |
| *දකුණට* | : | පාර |
| *බටහිරට* | : | පාර |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2026.03.19 දින සිට 2056.03.18 දක්වා);

(ආ) *වාර්ෂික බදු මුදල* .- ගරු ඇමතිතුමා අනුමත කරන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩු වන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපළ වටිනාකමින් 2% කි. ගරු ඇමතිතුමා අනුමත කරන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතුවිය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය;

(ඉ) *පළාත් ඉඩම් කොමසාරිස්/* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය;

(ඊ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය;

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(ඌ) 2026.03.19 දින සිට වසර 05ක් ගතවන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

(එ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදුගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 මැයි මස 13 දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
“මිහිකත මැඳුර”,
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

05-323

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය:- 4/10/73282
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය:- SPLC/MAT/4/24/06/31

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

මාතර දිස්ත්‍රික්කයේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 256ඒ හොරගල නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි උඩහොරගල ගමේ අ. ග. පි. 16 හි කැබලි අංක 332න් කොටසක් පෙන්විමට රජයේ මිනින්දෝරු එන්. එම්. මනම්පේරි මහතා විසින් අඳින ලද අංක MR/KTP/2016/147 අනුරේඛනයේ කැබලි අංක B මගින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0448 ක් වූ ඉඩම් කොටස සීමාරහිත හොරගල, නැගෙනහිර සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය විසින් රජයේ ඉඩම් ආඥා පනත යටතේ සමිති කටයුතු සඳහා බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ. :

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 332 හි කොටසක් (A) |
| *නැගෙනහිරට* | : කැබලි අංක 39හි කොටසක් (C) |
| *දකුණට* | : කැබලි අංක 332 |
| *බටහිරට* | : කැබලි අංක 332 |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :

(*අ*) බදු කාලය : අවුරුදු දහයයි. (10) (2026.01.28 දින සිට 2036.01.27 දින දක්වා)

(*ආ*) වාර්ෂික බදු මුදල : ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2026 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි.
වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ;

(*ඇ*) මෙම ඉඩම සමිති කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය;

(*ඈ*) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළයුතුය;

(*ඉ*) ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

(ඊ) සාදා ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වකින් පවත්වාගෙන යා යුතුය;

(*උ*) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත්වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(*ඌ*) **2026.01.28** දින සිට වසර 05 ක් ගතවනතුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

(එ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැරහැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොළියක් අයකරනු ලැබේ.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් උක්ත ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

**එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,**
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 මැයි මස 06 දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

05-285

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය:- 4/10/76557.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය:- SPLC/MAT/1/26/3/116.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත් 450ඩී, බඹරන්ද මධ්‍යම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බඹරන්ද මධ්‍යම ගමේ මුලික පිඹුරු අංක මාර 844 හි කැබලි අංක 72හි ප්‍රමාණයෙන් පර්චස් 28ක් වූ, සමුපකාර ප්‍රාදේශීකය පවත්වාගෙන යනු ලබන ඉඩම් කොටස සීමාසහිත දික්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතිය විසින් රජයේ ඉඩම් ආඥාපනත යටතේ සමිති කටයුතු සඳහා බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ.

| | |
|---|---|
| *උතුරට* | : මු. පි. මාර 844 කැබලි අංක 71 හා හි. පි. 152412 |
| *නැගෙනහිරට* | : මු. පි. මාර 844 කැබලි අංක 04 |
| *දකුණට* | : මු. පි. මාර 844 කැබලි අංක 75 |
| *බටහිරට* | : හි. පි. 152412 |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍යා කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) බදු කාලය : අවුරුදු තිහයි. (30) (2026.01.28 දින සිට 2056.01.27 දින දක්වා)

වාර්ෂික බදු මුදල : ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2026 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි.
වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ;

(ආ) මෙම ඉඩම සමිති කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඇ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය;

(ඈ) ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

(ඉ) සාදා ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වකින් පවත්වාගෙන යා යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත්වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) **2026.01.28 දින** සිට වසර 05 ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැරහැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොළියක් අයකරනු ලැබේ.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් උක්ත ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

**එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,**
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 මැයි මස 06 දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

05-282

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය:- 4/10/19519.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය:- SPLC/GAL/03/03/03/189.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 94ඒ, අම්බන උතුර ග්‍රාම නිලධාරි වසමේ අම්බන ගමේ පිහිටි අ. ග. පි. 604 පිඹුරේ කැබලි අංක 1257න් දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 20ක් වූ රජයේ ඉඩම් කොටස නේවාසික කටයුතු සඳහා සුනීත්‍රා රොබසිංහ ගුණවර්ධන මිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ. :

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 1256 |
| *නැගෙනහිරට* | : කැබලි අංක 1256 සහ 1230 |
| *දකුණට* | : කැබලි අංක 1230 සහ 1229 |
| *බටහිරට* | : කැබලි අංක 1229 සහ 1256 |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍යා කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(*අ*) *පළමු බදු කාලය* : අවුරුදු තිහයි. (30) (1995.06.15 දින සිට 2025.06.14 දින දක්වා)
*වාර්ෂික බදු මුදල :* ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි.
*දඩ මුදල* : ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි.)

*දෙවන බදු කාලය* : අවුරුදු තිහයි. (30) (2025.06.15 දින සිට 2055.06.14 දින දක්වා )

*වාර්ෂික බදු මුදල* : පළමු බදු කාලය අවසානයේ අය කළ බදු මුදලට 50% ක් එකතු කර ලබා ගන්නා මුදල දෙවන බදු කාලයේ ආරම්භක බදු මුදල වේ.

*වාර මුදල* : දෙවන බදු කාලය බැවින් වාර මුදලක් අය නොකෙරේ.

(*ආ*) බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය;

(*ඇ*) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය;

(*ඈ*) සාදා ඇති/ ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වකින් පවත්වාගෙන යා යුතුය;

(*ඉ*) ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය;

(*ඊ*) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත්වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.;

(*උ*) **1995.06.15** දින සිට අවුරුදු 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක;

(*ඌ*) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැරහැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම් අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොළියක් අයකරනු ලැබේ.

මෙම නිවේදනය ගැසට් කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් උක්ත ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

**තුසිත ගලප්පත්ති,**
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 මැයි මස 06 දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

05-286

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/71608.
අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : LC/PL/A4/21.

21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

උතුරුමැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 160, බටහිර අලුත්වැව ග්‍රාම නිලධාරි වසමේ අලුත්වැව ගමේ ජනපද නිලධාරි දළ අනුරේඛනයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 01 රූඩ් 01

පර්චස් 03ක් වූ රජයේ ඉඩම් කොටස රජයේ ඉඩම් ආඥාපනත යටතේ කෘෂිකාර්මික (ගොඩ) කටයුතු සඳහා වෙලේ කුඹුරේ රාජපක්ෂ සමරජීව මහතා විසින් දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ. :

*උතුරට* : කේ. කේ. නිහාල් ගුණරත්න, කේ. පී. මාහෙල්ගේ මඩ ඉඩම
*නැගෙනහිරට* : ගුරු පාර රක්ෂිතය
*දකුණට* : ගුරු පාර රක්ෂිතය
*බටහිරට* : ඒ. ඒ. ශ්‍රියානි අතුපත්තුගේ මඩ ඉඩම

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2026.03.19 දින සිට 2056.03.18 දක්වා);

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- 2026 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩු වන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2026 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ (රු. 5,000,000) හෝ රුපියල් මිලියන පහට (රු.5,000,000) වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතුවිය යුතුය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ;

*(ඇ)* මෙම ඉඩම **කෘෂිකාර්මික (ගොඩ)** කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය;

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ගේ/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළයුතුය;

*(ඉ)* ඉඩම් කොමසකාරිස් (අන්තර් පළාත්)ගේ/ ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.;

*(උ)* 2026.03.19 දින සිට වසර 05ක් ගතවන තුරු මෙම ඉඩම අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ඉන්පසු වුවද, අතුරු බදු හෝ පැවරීම් කළ හැක්කේ මෙම ඉඩම බදුගත් කාරණය සඳහා පමණි;

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදුනොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොලියක් අයකරනු ලැබේ.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

**එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,**
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 මැයි මස 07 දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

05-319

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/79114.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : එන්සීපී/පීඑල්සී/එල්02/ මනුප/04(1).

21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 306, ගම්බිරිගස්වැව ග්‍රාම නිලධාරි වසමේ ගම්බිරිගස්වැව ගමේ අ. ග. සි. අංක 477 පිඹුරේ කොටසක් පෙන්වීම සඳහා ඉඩම් නිලධාරි විසින් අඳින ලද දළ අනුරේඛනයෙහි කැබලි අංක 02න් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 04 රූඩ් 01 ක් පමණ වන රජයේ ඉඩම් කැබැල්ලක් **කෘෂිකාර්මික කටයුතු** සඳහා මුහම්මදු මහරුප් පාතිමා සැප්රිනා බේගම් මහත්මිය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ. :

*උතුරට* : එම්. අයි. එම්. මහරිබුගේ ඉඩම
*නැගෙනහිරට* : මාර්ග රක්ෂිතය

*දකුණට* : එම්. එම්. එම්. සර්හාන්ගේ ඉඩම
*බටහිරට* : රජයේ ඉඩම

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2025.05.23 දින සිට වසර 30ක් ඉදිරියට);

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- ගරු ඇමතිතුමා අනුමත කරන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩු වන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මකවන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහකට (5,000,000) වඩා වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතුවිය යුතුය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ;

*(ඇ)* මෙම ඉඩම **කෘෂිකාර්මික කටයුතු** සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය;

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළයුතුය;

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය;

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* 2025.05.23 දින සිට වසර 05ක් ගතවන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරන දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

**තුසිත ගලප්පත්ති,**
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 මැයි මස 16 දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

05-250

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.